මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MF1/Addl.Sec./General | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.07.29 |

## ප්‍රවෘත්ති නිවේදනය

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ පැවති සාකච්ඡාවන්හි ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා සහාය දීම පිණිස දීර්ඝකාලීන මූල්‍ය පහසුකම් (Extended Financing Facility) සඳහා එළඹීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡාවල නිරතවන ලදී. 2022 වසරේ අප්‍රේල් මාසයේ වසන්ත රැස්වීම්වලින් (Spring Meetings) අනතුරුව, මැයි මස ආරම්භයේ මාර්ගගත දූත සාකච්ඡා (Virtual Mission) පැවති අතර, ජූනි මස 20 සිට 30 දක්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිස් කොළඹදී සාකච්ඡා පවත්වන ලදී. කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට (Staff Level Agreement) එළඹීම පිණිස මාර්ගගත ක්‍රමය ඔස්සේ දිගින් දිගටම සාකච්ඡා පවත්වා ගෙන යන ලදී. සාකච්ඡා අතරතුර, ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳව සැලකිය යුතු ප්‍රගතියක් අත්පත්කරගන්නා ලදී.

මැයි මාසයේ සිට ඇති වූ සමාජ නොසන්සුන්තාවයන් සහ දේශපාලන අස්ථාවරත්වය මත පරිපාලනයේ වෙනස්කම් කිහිපයක් සිදුවීම් හේතුවෙන් කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයෙහි සැලකිය යුතු කාර්යසාධනයක් ළඟා කර ගැනීම පමා වී ඇත. කෙසේ වෙතත්, කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළඹීමට පෙර එකඟ විය යුතු, තවදුරටත් ඉතිරිව ඇති ප්‍රතිපත්තිමය කරුණු කිහිපයක් අවසන් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා බලධාරීන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර තාක්ෂණික සාකච්ඡා නව රජය පිහිටුවීමත් සමඟ යළි ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාවට බෙහෙවින් අවශ්‍ය බාහිර මූල්‍යකරණයට සහාය වීමට සහ මූල්‍යකරණ බාධක දුරලීමට උපකාරී වූ දීර්ඝකාලීන මූල්‍ය පහසුකම් වැඩසටහන සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම ඉතා වැදගත් සන්ධිස්ථානයක් වනු ඇත.

ඒ හා සමගාමීව, ශ්‍රී ලංකා බලධාරීන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපදේශකවරුන් වන ලසාඩ් (Lazard) සහ ක්ලිෆර්ඩ් චාන්ස් (Clifford Chance) සමඟ එක්ව ණය හිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳව එකඟතාවයකට පැමිණීමට කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකාවේ ණය හිමියන් සමඟ විධිමත්ව කටයුතු ආරම්භ කිරීමට පෙර, ණය මෙහෙයුම සඳහා වූ විශ්ලේෂණාත්මක රාමුව සමඟ ණය උපදේශකයන් සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත. සියළුම පාර්ශවකරුවන් වෙත සාධාරණ සහ තිරසාර ප්‍රතිඵල ලගාකර ගතහැකි පුළුල් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් ඇති කර ගැනීම සඳහා රජය සිය ණය හිමියන් සමඟ සත්භාවයෙන් කටයුතු කිරීමට බැඳී සිටී.

මාධ්‍ය ඒකකය
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය